විෂයය - සිංහල භාෂාව හා සාහිත්‍යය

ශ්‍රේණිය - 11

වාරය - 03

ඒකකය- අද්‍යතන සාහිත්‍ය නිර්මාණයන්හි භාෂාව

ඉගෙනුම් පල -

- අද්‍යතන සාහිත්‍ය නිර්මාණ පරිශීලනය කර අදහස් ප්‍රකාශ කරයි.
- භාෂාවේ සුවිශේෂතා හඳුනා ගෙන ඉදිරිපත් කරයි.
- අර්ථාන්විත ව භාෂාව භාවිත කරයි.

## ක්‍රියාකාරකම i

1. වඩාත් නිවැරදි අදහස අන්තර්ගත ප්‍රකාශය තෝරන්න.

   i. භාෂාව යනු ලේඛන මාධ්‍යයකි.
   ii. භාෂාව යනු ප්‍රකාශන මාර්ගයකි.
   iii. භාෂාව යනු සාහිත්‍ය සන්නිවේදන ක්‍රමයකි.
   iv. භාෂාව යනු මනුෂ්‍යයාගේ හැඟීම් හා අදහස් ප්‍රකාශ කිරීමේ මාර්ගයකි.

2.

   i. සාහිත්‍යකරුවා භාෂාව භාවිත කරනුයේ නිශ්චිතාර්ථ දැනවීම පිණිස ය.
   ii. සාහිත්‍යකරුවාගේ භාෂාවේ විශේෂත්වය වන්නේ භාවික ගුණය යි.
   iii. සාහිත්‍යකරුවාගේ භාෂාව ලක්ෂ්‍යාර්ථයෙන් යුක්තයි.
   iv. සාහිත්‍යකරුවාගේ භාෂාව වාර්තාත්මක යි.

3. කෙටි පිළිතුරු ලියන්න.

   i. යටත් විජිත පාලකයන් ඉංග්‍රීසි අධ්‍යාපනය හා මුද්‍රණශිල්පය මෙරට ප්‍රචලිත කළේ කවර අරමුණකින් ද?
   ii. ශ්‍රාවකයා වෙනුවට පාඨකයෙක් නිර්මාණය වූයේ කුමක් නිසා ද?
   iii. ක්‍රිස්තියානි ධර්ම ග්‍රන්ථ සිංහලයෙන් මුද්‍රණය කිරීමට පෙර මෙරට භාවිතයෙහි පැවැති ග්‍රන්ථ විශේෂය කුමක් ද?
   iv. දහනව වන සියවසේ අග භාගයෙහි සිංහල රචනා විලාසයේ මූලික ලක්ෂණයක් ලෙස මේ පාඩමේ දක්වන කරුණ කුමක් ද?
   v. පාඨකයා ආකර්ෂණය කර ගැනීම සඳහා මුල් කාලීන පුවත්පත් සඟරා කතුවරුන් යොදා ගත් උපක්‍රමයක් නම් කරන්න.

4. ''ලුසී'' යන චරිතය අන්තර්ගත කෘතිය වන්නේ මේ අතුරෙන් කුමක් ද?

   i. මීනා
   ii. ජයතිස්ස හා රොසලින්
   iii. ගම්පෙරළිය
   iv. වාසනාවන්ත සහ කාලකණ්ණි පවුල්

5. මාර්ටින් වික්‍රමසිංහ මහතාගේ මුල් ම නව ප්‍රබන්ධ කෘතිය

i. ගම්පෙරළිය යි.
ii. යුගාන්තය යි.
iii. ලීලා යි.
iv. අයිරාංගනී යි.

## ක්‍රියාකාරකම ii

1. ''අම්මා කියනවා ගෙදර ඉන්ඩ කියලා'' මෙම පාඨය උපුටා ගත් කෘතිය නිවැරදි ව දැක්වෙන වරණය තෝරන්න.

i. සුන්නද්දූලි
ii. හෙයියම්මාරුව
iii. වඩබාගින්න
iv. කරුමක්කාරයෝ

2. මෙම පාඩමෙහි සඳහන් නො වන කතුවරයකුගේ නම ද ඇතුළත් වරණය තෝරන්න.

i. ඇල්. අයිසෙක් ද සිල්වා, මාර්ටින් වික්‍රමසිංහ, සිරිගුනසිංහ
ii. ගුණදාස අමරසේකර, අනුලා විජේරත්න මැණිකේ, අජිත් තිලකසේන
iii. සයිමන් ද සිල්වා, පියදාස සිරිසේන, ඩබ්ලිව්. ඒ. සිල්වා
iv. ඒ. වී. සුරවීර, ඇල්බට් ද සිල්වා, ගුණදාස අමරසේකර

3.

A. මීනා - ඇල්. අයිසෙක් ද සිල්වා

B. පූජාවලිය - ගුණදාස අමරසේකර

C. හෙයියම්මාරුව - ඒ. වී. සුරවීර

D. හෙවණැල්ල - අජිත් තිලකසේන

E. යුගාන්තය - මාර්ටින් වික්‍රමසිංහ

ඉහත වරණයන්ගෙන් නිවැරදි වන්නේ;

i. A සහා C ය.
ii. E සහ B ය.
iii. D සහ E ය.
iv. C සහ E ය.

4.

A. ගම්පෙරළිය
B. මීනා
C. වාසනාවන්ත සහ කාලකණ්ණි පවුල්
D. ජයතිස්ස හා රොසලින්

ඉහත ග්‍රන්ථ පළ කළ වර්ෂයන්ගේ නිවැරදි අනුපිළිවෙළ වන්නේ;

i. 1944, 1905, 1886, 1906
ii. 1905, 1906, 1944, 1886
iii. 1906, 1986, 1905, 1944
iv. 1986, 1944, 1906, 1905

5. ක්‍රීඩාවක් ගැන කියැවෙන පාඨය උපුටා ගෙන තිබෙන කෘතිය නිවැරදි ව දැක්වෙන වරණය කුමක් ද?

i. පූජාවලිය
ii. සුන්නද්දූලි
iii. ගම්පෙරළිය
iv. වඩබාගින්න

## ක්‍රියාකාරකම iii

1. පහත සඳහන් ඡේදයේ අන්තර්ගත නිපාත පද උපුටා දක්වන්න.

'' සාහිත්‍යකරුවන් නො වන අනෙකුත් ලේඛකයන් භාෂාව ව්‍යවහාර කරනුයේ නිශ්චිතාර්ථ දැනවෙන ආකාරයෙන් වුව ද සාහිත්‍යකරුවා භාෂාව භාවිත කරනුයේ භාවික ගුණයෙන් යුතු ව ය. එනම්; .... සාහිත්‍යකරුවා ඉදිරිපත් කරන අත්දැකීම් හා ඒ සඳහා යොදා ගන්නා බස්වහර අතර අත්‍යන්ත සම්බන්ධතාවක් පවතියි.

2.

i. අම්මා බසයෙන් වැඩට යයි. ත්‍රීරෝද රථයෙන් ද යයි.
ii. සේවකයා වේලාසනින් කාර්යාලයට පැමිණෙයි. රාජකාරී අරඹන්නේ ප්‍රමාදව ය.
iii. අපට පොතපතින් රස වින්දනයක් ලැබෙයි. ජීවිතාබෝධය ලැබෙයි.
iv. මාතර අවධියේ ප්‍රකට කිවිඳිය දෝන ඉසබෙලා ය. ගජමන් නෝනා ය.

ඉහත වාක්‍ය තනි වාක්‍යයක් ලෙස ගැළපීමේ දී නිපාත පද භාවිතයේ වඩාත් යෝග්‍ය අනුපිළිවෙළ වන්නේ කුමක් ද?

P නමුත් T නැතිනම් S හෙවත් K මෙන් ම


i. KTPS
ii. KPTS
iii. TPKS
iv. PKTS

3. ''වැළි'' යන්න පුනරාර්ථය දෙන නිපාතයක් නම්, '' වූ කලි'' යනු කිනම් අර්ථයේ නිපාතයක් ද?

4. ''ද'' නිපාතය අර්ථ කීපයක යෙදේ ඒ මොනවා ද?

5. දී ඇති නිපාත පද අර්ථය අනුව නිවැරදි වෘත්තයෙහි බහාලන්න .

| |
|---|
| ලෙස, මුත්, හොත්, බැවින්, එහෙත්, බොහෝ, මෙන්, මිස, නිසා, හැර, විනා, යළි, නැවත, දක්වා, තුරු, පටන්, තව, නොහොත්, ඉතා, හෙයින්, හෝ, පුන, සිට, පවා |




6. සෑම වරණයක ම නිපාත පදයක් නො වන පදය යටින් ඉරක් අඳින්න.

i. ගෙන්, මෙන්, සෙන්, කෙරෙන්
ii. නොලසා, සලසා, ලෙස, විලස
iii. නිබඳ, සෙද, පිළිබඳ, සබඳ
iv. උදෙසා, දෙසා, නිසා, තකා
v. තරම්, පමණ, කෙරෙන්, වෙරෙන්

## ක්‍රියාකාරකම iv

1. අව්‍යය පද යනු;

i. නිපාත හා උපසර්ගයි.
ii. නාම හා ක්‍රියා පදයි.
iii. වරනැඟෙන පද හා වර නොනැඟෙන පදයි.
iv. තද්ධිත හා කෘදන්ත පදයි.

2. උපසර්ගයකින් නො කරන කාර්යයක් වන්නේ;

i. ප්‍රකෘතියේ අර්ථයට විරුද්ධාර්ථයක් දීම
ii. ප්‍රකෘතියේ අර්ථයට අනුව සිටීම
iii. ප්‍රකෘතියේ අර්ථය වෙනස් කිරීම
iv. ප්‍රකෘතියේ අර්ථය තීව්‍ර කිරීම

3. උපසර්ගයක් නො වන පදයක් අන්තර්ගත වරණය තෝරන්න.

i. පර, උප, අනු, සු
ii. පිළි, අධි, අපි, ප්‍රති
iii. උද්, අබි, උප, අව
iv. දු, ලහු, නො, නි

4. පහත සඳහන් ඡේදයේ අන්තර්ගත උපසර්ග පද උපුටා දක්වන්න.

හොඳ කලා නිර්මාණයක් බිහි වන්නේ අත්දැකීම්වල මෙන් ම පරිකල්පනයේ ද සංකලනයෙන් බව කිව හැකි ය. හොඳ කලාකරුවාගේ කාර්යය සත්‍යය ඉදිරිපත් කිරීම යැයි පිළිගැනේ. කලාකරුවා සිදු කරනුයේ යම් අත්දැකීමක් සහෘදයාගේ සිත තුළ ප්‍රතිනිර්මාණය කිරීමයි. අත්දැකීමක් ඉදිරිපත් කළ යුත්තේ අත්දැකීමෙන් ඈත් වී එය විග්‍රහ කරමින් ය. සුදන දුදන ලෙස චරිත වර්ග නො කරන කලාකරුවා සෑම චරිතයක ම අභ්‍යන්තර හා බාහිර ගති ඉසියුම් නිරීක්ෂණයෙන් ග්‍රහණය කොට ගෙන ඉදිරිපත් කළ යුතු ය.

5. මුලින් දැක්වෙන පදයෙහි විරුද්ධාර්ථය දෙන උපසර්ගය සහිත පදය ලියන්න.

i. ආයාත - ----------------------------
ii. පූර්ව - ------------------------------
iii. අවධානය - ------------------------------
iv. ප්‍රාචීන - ------------------------------
v. විප්‍රයෝග - ------------------------------
vi. අභිමුඛ - -------------------------------
vii. උපස්ථිතිය - ---------------------------------
viii. උත්තල - --------------------------------
ix. ආර්ය - ---------------------------------
x. කීර්තිය - ---------------------------------

## පිළිතුරු

### ක්‍රියාකාරකම i

1.-iv 2-ii

3.

i. යුරෝපීය ශිෂ්ටාචාරය රෝපණය කිරීමට
ii. මුද්‍රණ ශිල්පය නිසා
iii. පුස්කොළ පොත් ය.
iv. කථා ව්‍යවහාරය පදනම් කොට ගනිමින් සකස් කර ගත් ලේඛනය
v. යුරෝපීය භාෂාවලින් ලියැවුණු කථාන්තරවල සිංහල පරිවර්තන පුවත්පත් සඟරාවල පළ කිරීම

4- iv 5- iii

### ක්‍රියාකාරකම ii

1- ii 2-iv 3-iv 4-l 5-iii

### ක්‍රියාකාරකම iii

1. නො, ද, ව, ය, හා, සඳහා

2. iii

3. උපන්‍යාසාර්ථයේ

4

i. සමුච්චයාර්ථය
ii. ප්‍රශ්නාර්ථය
iii. අවමාර්ථය

5.

| | | | |
|---|---|---|---|
| අනියමාර්ථය<br>හොත්<br>නොහොත් | අතිශයාර්ථය<br>බොහෝ<br>ඉතා<br>තව | අවධාරණාර්ථය<br>මුත් මිස<br>හැර විනා<br>පවා | සමානාර්ථය<br>මෙන්,<br>ලෙස |
| හේත්වාර්ථය<br>හෙයින්,<br>නිසා,<br>බැවින් | සීමාර්ථය<br>දක්වා<br>තුරු<br>පටන් සිට | පුනාර්ථය<br>යළි<br>නැවත<br>පුන, | සම්බන්ධාර්ථය<br>එහෙත්<br>නොහොත්<br>හෝ, |

6

i. සෙන්
ii. සලසා
iii. සබඳ
iv. දෙසා
v. වෙරෙන්

ක්‍රියාකාරකම iv

1-i 2-iii 3-iv

4. නිර්මාණයක්, පරිකල්පනයේ, සංකලනයෙන්, පිළිගැනේ, සහෘදයාගේ, ප්‍රතිනිර්මාණය, විග්‍රහ, සුදන, දුදන, අභ්‍යන්තර, ඉසියුම්, නිරීක්ෂණ

5.

i. නිර්යාත
ii. අපූර්ව
iii. අනවධානය
iv. ප්‍රතිචීන
v. සම්ප්‍රයෝග
vi. අනභිමුඛ
vii. අනුපස්ථිතිය
viii. අවතල
ix. අනාර්ය
x. අපකීර්තිය